සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

**දෙවන වාර පරීක්ෂණය - 07 ශ්‍රේණිය - 2023**
**Second Term Test - Grade 07 - 2023**

# ගණිතය

කාලය පැය 02


නම / විභාග අංකය:

## I කොටස

❖ **සියළුම ප්‍රශ්න වලට සපයා ඇති ඉඩ ප්‍රමාණයේ පිළිතුරු සපයන්න.**
**එක් ප්‍රශ්නයක් සඳහා ලකුණු 2 බැගින් හිමිවේ.**

(01) A = { 20400 යන සංඛ්‍යාවේ ඉලක්කම්}
අවයව සඟල වරහන් තුළ ලිවීමෙන් A කුලකය ලියා දක්වන්න.

(02) ද්විපාර්ශ්වික සමමිතික රූපයක් ලැබෙන සේ පහත රූපය සම්පූර්ණ කරන්න.




(03) සුළු කරන්න
12 + 5 ( 2 +2 ) – 1


(04) පැනක මිල රු 35.00 නම් එම වර්ගයේ පෑන් 12 ක් අඩංගු පෙට්ටියක මිල කීයද?

(05) පහත දැක්වෙන සංඛ්‍යා අතරින් 9 න් ඉතිරි නැතිව බෙදෙන සංඛ්‍යා යටින් ඉරක් අඳින්න
270 , 543 , 6039 , 759 , 156

(06) අරය සමාන වෘත්ත 3ක් රූපයේ දී ඇත
AB දුර 8 cm ක් නම් එක් වෘත්තයක අරය කීයද?



(07) සංඛ්‍යා රේඛාව භාවිතයෙන් (-3)+(+5) හි අගය සොයන්න.




---

(08) 30, 24 , 15 යන සංඛ්‍යාවල කුඩාම පොදු ගුණාකාරය සොයන්න.

---

(09) විසඳන්න.

$3x - 5 = 7$

---

(10) 18 ප්‍රථමක සංඛ්‍යාවල, බලයන්හි ගුණිතයක් ලෙස දක්වන්න.

---

(11) සහන්ගේ උපන්දිනය 2011.08.13 වේ. ඔහුගේ මල්ලී ඔහුට වඩා අවුරුදු03 මාස 07 දින 04 බාලය. මල්ලිගේ උපන්දිනය සොයන්න.

---

(12) $\frac{1}{5}, \frac{1}{3}, \frac{4}{15}$ යන භාග ආරෝහණ පටිපාටියට ලියන්න


---

(13) හිස්තැනට ගැලපෙන සංඛ්‍යාව ලියන්න.

30.4 ÷ 10 = .............

---

(14) සෘජුකෝණාස්‍රයේ දිග $2\ell$ හා පළල $\ell$ නම් පරිමිතිය p සඳහා සූත්‍රයක් ලියන්න.



(15) සුළු කරන්න.

3 kg 750 g ÷ 6

---

(16) < හෝ > හෝ = යන සංකේත අතුරින් සුදුසු සංකේතය තෝරා හිස්තැනෙහි ලියන්න.


$4\frac{2}{3}$ .........$4\frac{5}{12}$

---

(17) a = 2 , b = 3 වන විට $ab^2$ හි අගය සොයන්න.

---

(18) රූපයේ දී ඇති මිනුම් අනුව මුළු රූපයේ වර්ගඵලය සොයන්න.




---

(19) $\frac{4}{25}$ දශම ආකාරයෙන් ලියන්න.


---

(20) P මගින් සංඛ්‍යාවක් දැක්වේ. P ට වඩා $x$ ප්‍රමාණයක් අඩු සංඛ්‍යාව, P හා $x$ ඇසුරෙන් දක්වන්න.

# II කොටස


- ➢ **පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.**
- ➢ **පළමු ප්‍රශ්නයට ලකුණු 16 ක්ද අනෙකුත් ප්‍රශ්න සඳහා ලකුණු 11 බැගින්ද හිමිවේ.**

(01) I. පහත දී ඇති වගුව පිළිතුරු පත්‍රයේ පිටපත් කර නිවැරදි රූපයට අදාල අක්ෂරය යොදා ගනිමින් එය සම්පූර්ණ කරන්න.




| විෂම පාද ත්‍රිකෝණ | ඍජුකෝණික ත්‍රිකෝණ | සමපාද ත්‍රිකෝණ | සමද්විපාද ත්‍රිකෝණ | විෂම පාද මහාකෝණික ත්‍රිකෝණ |
|---|---|---|---|---|
| | | | | |

II. වරහන් තුල දී ඇති වචන අතුරින් සුදුසු වචන යොදා හිස්තැන් සම්පූර්ණ කර ලියන්න.




බහු අස්‍රයක සියළුම ................. සමාන වේ නම් හා සියළුම අභ්‍යන්තර ............... වල විශාලත්වය සමාන වේ නම් එය ................. බහු අස්‍රයක් වේ. මේ අනුව (a)..................... බහු අස්‍රයක් වන අතර (b) ...................... බහු අස්‍රයක් වේ.

(කෝණ , පාද , සවිධි , උත්තල , අවතල )

iii. ඉහත ii හි (b) රූපයේ පාදයක දිග 9cm වේ. (a) හා (b) රූපවල පරිමිති සමාන වේ නම් (a) රූපයේ පාදයක දිග සොයන්න.

(02) (a) සුළු කරන්න.

i. $\frac{5}{8}+\frac{2}{8}$

ii. $3\frac{3}{4}+\frac{1}{6}$

iii. $4\frac{2}{5}-1\frac{2}{3}$

(b) පන්තියක ළමුන්ගෙන් $\frac{2}{5}$ක් සංගීතය විෂයයද $\frac{1}{3}$ක් නර්තන විෂයයද හදාරති. ඉතිරි පිරිස චිත්‍ර විෂයය හදාරයි නම් චිත්‍ර විෂය හදාරන පිරිස භාගයක් ලෙස දක්වන්න.

(03) කවකටුව, සරල දාරය හා කෝණමානය යොදා ගනිමින් පහත ක්‍රියාකාරකම සිදු කරන්න.

i) අරය 4 cm වනසේ වෘත්තයක් ඇඳ එහි කේන්ද්‍රය O ලෙස නම් කරන්න.


ii) විෂ්කම්භයක් ඇඳ එය AB ලෙස නම් කරන්න.

iii) $B\hat{A}C = 60^{0}$ වන සේ C ලක්ෂ්‍යයක් වෘත්තය මත ලකුණු කරන්න.

iv) $A\hat{C}B$ කෝණයෙහි අගය මැන ලියන්න

(04) (a) සෘජුකෝණාස්‍රයක වර්ගඵලය 48 $cm^2$ ක් වේ. එහි දිග හා පළල සඳහා තිබිය හැකි අගය යුගල 2 ක් ලියන්න.

(b) මීටර 15 ක් දිග මීටර 10 ක් පළල ABCD සෘජුකෝණාස්‍රාකාර බිම් කොටසක ඇතුලතින් 2m ක් පළලට කැට අතුරා ඇති අතර, රූපයේ එය අඳුරු කර දක්වා ඇත. ඉතිරි කොටසෙහි තණකොල වවා ඇත.




i) ABCD සෘජුකෝණාස්‍රාකාර බිම් කඩෙහි වර්ගඵලය සොයන්න.

ii) තණකොල වවා ඇති කොටසේ වර්ගඵලය සොයන්න.

iii) ඒ අනුව කැට අතුරා ඇති කොටසේ වර්ගඵලය සොයන්න.

05) a) මා ළඟ රුපියල් $x$ මුදලක් ඇත. මල්ලි ළඟ මට වඩා රු 100 ක මුදලක් ඇත.

- i) මල්ලි ළඟ ඇති මුදල $x$ ඇසුරින් ලියා දක්වන්න.
- ii) මා සහ මල්ලි යන දෙදෙනාම ළඟ ඇති මුදල $x$ අයුරින් ලියන්න .
- iii) අප දෙදෙනා ළඟ ඇති මුදල රු 400 නම් $x$ ඇතුලත් සරල සමීකරණයක් ගොඩනගන්න.
- iv) එම සමීකරණය විසඳීමෙන් $x$ හි අගය සොයා දෙදෙනා ළඟ ඇති මුදල වෙන වෙනම ලියන්න.

b) සුළු කරන්න.

$$7 + 5x + 2y - 4x + 3y - 3$$

06) බීමට ගන්නා ජලය පිරිපහදු කරන ආයතනයක ඇති ඝනකාභ හැඩති ජල ටැංකියක දිග 2m, පළල 1.5m හා උස 0.6 m වේ.

- i) මෙම ටැංකියේ දිග, පළල හා උස සෙන්ටි මීටර් ඇසුරින් දක්වන්න.
- ii) ඝනකාභ හැඩති ජල ටැංකියේ ධාරිතාව ඝන සෙන්ටි මීටර් වලින් සොයන්න.
- iii) ඉහත ධාරිතාව ලීටර් ඇසුරින් ලියා දක්වන්න.
- iv) මෙම ටැංකිය සම්පූර්ණයෙන්ම පිරී ඇති විට, ධාරිතාව 600 ml වන බෝතල් කොපමණ සංඛ්‍යාවක් පිරවීමට එම ජලය ප්‍රමාණවත්ද?
- v) ජලය 600 ml ක බෝතලයක් වෙළඳ පොළට නිකුත් කිරීමේ දී රු. 40 ක අදායමක් ලබයි නම්, ඉහත ප්‍රමාණයේ එක් ජල ටැංකියකින් ලැබෙන මුදල සොයන්න.

07) a) 10g 700 mg බැගින් වූ චොක්ලට් බෝල 25 ක් පෙට්ටියක අසුරා ඇත. එම ඇසුරුමේ ස්කන්ධය 7 g 450 mg කි.

- I. මෙම ඇසුරුමේ අඩංගු චොක්ලට් වල මුළු ස්කන්ධය සොයන්න.
- II. ඇසුරුම සමඟ චොක්ලට් ස්කන්ධය සොයන්න.

(b) දොළොස් දෙනෙකුගෙන් යුතු නැටුම් කණ්ඩායමකට අවශ්‍ය රෙදි ප්‍රමාණය 28m 80 cm වන අතර එහිදී එක් අයකුට වෙන්කරන රෙදි ප්‍රමාණය සොයන්න. මේ සඳහා 30.5 m දිග රෙදි රෝලක් මිලදී ගත්තේ නම් ඉතිරි රෙදි කැබැල්ලේ දිග සොයන්න.


Downloaded from Past Papers Wiki - Extensive collection of Past papers, Notes and much more!

(8) WWW.PastPapers.WiKi (8)



Downloaded from Past Papers Wiki - Extensive collection of Past papers, Notes and much more!


LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
සතර
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න